දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණු විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය
2011 ඔක්තෝබර්/නොවැම්බර්
General Degree Examination in Arts (External) Part I
October/November 2011

# සිංසා 2.2 - සිංහල නාට්‍ය හා රංග කලාව
# SLG 2.2 - Sinhala Drama and Theatre

කාලය පැය තුන යි.

**එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.)

---

## I කොටස

(01) 'නාට්‍යය යනු නාට්‍ය පිටපත නොවේ.' පහදන්න.

(02) රංගභූමි සැලසුම් හෝ වෙස් මෝස්තර නිර්මාණය හෝ නාට්‍යයේ සාර්ථකත්වය කෙරේ බලපාන ආකාරය විමසන්න.

(03) 'ලෝකයේ වෙනත් රටවල මෙන් ම ලක්දිව නාට්‍ය කලාවේ ද උපත සෙවිය යුත්තේ ලාංකික ආගමේ වන්දනාමාන පූජෝත්සව හා යාගහෝම ආදියෙහි ය' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(04) 'සොකරි යනු යාතුකර්ම ලක්ෂණ ගැබ් වූ ගැමි නාටකයකි' සාකච්ඡා කරන්න.

(05) පහත දැක්වෙන මාතෘකා පිළිබඳ කෙටි විවරණ සපයන්න.
1. පාත්‍රවර්ගයා සහ නළු නිළියෝ
2. තේමාව සහ කථා වින්‍යාසය
3. කථනය හා ප්‍රදර්ශනය
4. ප්‍රවාදී චරිත හා ප්‍රතිවාදී චරිත
5. ප්‍රේක්ෂාව සහ ප්‍රේක්ෂකයා

## II කොටස

(06) '<u>ශකුන්තලා</u> නාට්‍ය රචනයේ දී කාළිදාසයන් විසින් මූලාශ්‍රයයේ සිදු කරන ලද වෙනස ඔහුගේ නාට්‍ය කලා කෞශල්‍යය ප්‍රකට කරන්නකි' පහදන්න.

(07) 'පාත්‍රයන් වරදවා සිතා ගන්නා ඇතැම් දේවල් ප්‍රේක්ෂකයා දැනීමෙන් <u>රත්නාවලියේ</u> හාස්‍ය රසය මතු වෙයි' නිදසුන් සහිත ව ඔබේ අදහස් දක්වන්න.

නැතහොත්

'රත්නාවලියේ අන්තර්ගත කාව්‍යමය ගුණය එය ප්‍රේක්ෂක සිත් දිනා ගැනීමට සමත් වන ප්‍රමුඛ සාධකයකි' සනාථ කරන්න.

(08) ශකුන්තලා නාටකයේ තේමාව හා කථා වින්‍යාසය සංස්කෘත නාට්‍ය රංග රීතියට අනුකූල ව විග්‍රහ කොට දක්වන්න.

(09) සිංහබාහු නාටකයේ පාත්‍ර වර්ගයාගේ සංකීර්ණ මනෝභාව නිරූපණයේ ලා නාට්‍යකරුවා විසින් උපයුක්ත නාට්‍යගත කාව්‍යභාෂාවේ ශක්‍යතා විමසුමට ලක් කරන්න.

oooooooooooooooooooooooooooo